සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்

**Department of Samurdhi Development**

සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

சமூக வலுவூட்டல் அமைச்சு

**MINISTRY OF SOCIAL EMPOWERMENT**


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/SW/14/18/04/18 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2018.08.20 |
|---|---|---|---|---|---|

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>නව සමෘද්ධි සහනාධාර ලබාදීම සඳහා සුදුසු පවුල් තෝරා ගැනීම</u>**

නව සමෘද්ධි සහනාධාර ලබාදීම සඳහා සුදුසු පවුල් තෝරා ගැනීම සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කරන ලද මාගේ සමාංක 2018/08/09 දිනැති ලිපියට අමතර වශයෙනි.

එකී ලිපිය මගින් ලබාදුන් උපදෙස් අනුව මේ වන විට වසම් මට්ටමින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත්‍ර සමීක්ෂණයට භාජනය කර සහනාධාර ලබා දීමට සුදුසු ප්‍රතිලාභීන් ප්‍රමුඛතා ගත කරමින් පවතී. ඒ සඳහා මීට පෙර සමෘද්ධිලාභීන් තේරීම සඳහා භාවිතා නරනු ලැබූ නිර්ණායක යොදා ගනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

එහෙත් සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මගින් නිශ්චිත නිර්ණායක ඉදිරිපත් කරන ලෙස කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන, එකී නව සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරාගැනිමේ ක්‍රියාවලිය තව දුරටත් විධිමත් කිරීම සඳහා පහත සඳහන් නිර්වචනයන් හා මඟපෙන්වීම්ද, අනුගමනය කිරීමට හැකියාව ඇත.

**01.** **<u>පවුල් ඒකකයක් හඳුනා ගැනීම</u>**

මව, පියා, ඇතුළු අවිවාහක දරුවන් හා එම පවුලෙන් යැපෙන වැඩිහිටියන් සහ වෙනත් අයද එකම නිවසක් තුල පදිංචිව සිටීම. (එකම නිවසක වෙනම පවුලක් ලෙස කටයුතු කිරීම පිළිබඳ සාධක පවතී නම් වෙනම පවුලක් ලෙස සැලකිය හැකිය.)

**02.** **<u>නව සමෘද්ධි සහනාධාර ලැබීම සඳහා නුසුදුසු පවුල් හඳුනා ගැනිම</u>**

- රජයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථිර රැකියාවක් කරන සාමාජිකයකු පවුල් ඒකකය තුළ සිටීම.
- රැකියාවක නිරතව සිටීම හේතුවෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නෙකු පවුල් ඒකකය තුළ සිටීම.
- ප්‍රමාණවත් ආදායම් උත්පාදන ක්‍රියාදාමයක් තුළින් සවිබලගැන්වී ඇති පවුල්.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

- පුහුණු ශ්‍රමය හා ශිල්පීය දැනුම උපයෝගී කරගෙන ආදායම් උත්පාදන ව්‍යාපෘතිවල නියැලී සිටින පවුල්.

ඉහත කරුණු හා ඒ ඒ ප්‍රාදේශීය ලේකම්/ ග්‍රාම නිලධාරි කොට්ඨාශ වලට හඳුනාගත හැකි සමාජ හා ආර්ථික නිර්ණායක මත සහනාධාර ලැබීමට නුසුදුසු වන පවුල්, ග්‍රාමීය කමිටුවේ එකඟතාවය මත තීරණය කළ යුතු වේ.

## 03. <u>නව සමෘද්ධි සහනාධාර ලැබීම සඳහා සලකා බැලිය යුතු නිර්ණායක</u>

- පවුලේ ආර්ථික තත්වය :-

ඒක පුද්ගල මාසික ආදායම රු 6000//- ට අඩුවීම.

- පවුලේ සමාජිකයින්ගේ සෞඛ්‍ය තත්වය :-

පවුලේ සමාජිකයින් නිදන්ගත රෝග, අබාධිත තත්වයන්ගෙන් පෙලෙන්නේද යන වග.

- වත්කම්:-

චංචල හා නිශ්චල දේපළ වල හිමිකාරිත්වය.

- අවධානය යොමුකල යුතු වෙනත් කරුණු :-

පවුලේ සමාජික සංඛ්‍යාව, කාන්තා මූලික පවුල්, දෙමාපියන් අහිමිවීම, ආපදා තත්වයන්ට නිරන්තරව ලක්වීම ආදී කරුණු.

ඒ අනුව මෙම කාර්යයට අදාලව මීට ඉහත ලබා දුන් උපදෙස් පරිදි දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් විසින් තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත්, ප්‍රමුඛතා ලේඛණ ගත කරන ලද නව සමෘද්ධි සහනාධාර ලැබීම සඳහා සුදුසුකම් ලබන පවුල් සංඛ්‍යාව මා වෙත ඉදිරිපත් කිරිමෙන් අනතුරුව, ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට හිමිවන නව සහනාධාර සංඛ්‍යාව ඔබ වෙත දැනුම් දෙනු ඇත.

ඉහත උපදෙස් මත පළමු වටය සඳහා ඉතාමත්ම සුදුසු පවුල් හඳුනා ගැනීම අපේක්ෂා කරන අතර, ඉතිරිවන අයදුම්පත් ඊළඟ අදියරයන් යටතේ සළකා බැලීම සඳහා ග්‍රාම නිලධාරි මට්ටමින් ගොනු කර තැබිය යුතු වේ. ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයන් මත ඒ පිළිබඳ උපදෙස් ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. තවදුරටත් සමෘද්ධි සහනාධාර ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් භාර ගැනීමට කටයුතු කළ යුතු අතර, ඊළඟ අදියරයන් යටතේ සළකා බැලීම සඳහා ඒවා ගොනු කර තැබීමට කටයුතු කළ යුතු වේ.

ජේ දඩල්ලගේ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

| | | |
|---|---|---|
| 01) ලේකම්, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 02) සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - | කා.දැ.ගැ.ස. |
| 03) සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් | - | කා.දැ.ගැ.ස. සහ අ.ක.ස. |